RARE

# සාධක ඵලදායිතාව හා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය

RECEIVED
25 NOV 2016
University of Kelaniya

කේ.එස්.ඒ.කේ.සේනානායක
PGS/E/MSSC/2003/25

25 NOV 2016

සමාජීය විද්‍යාපති ආර්ථික විද්‍යා උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරණු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1267 |
| වර්ග අංකය: | |

UNIVERSITY OF KELANIYA

දෙසැම්බර් 2014

# සාධක ඵලදායිතාවහා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය

## නිබන්ධ සාරාංශය


ආර්ථික විද්‍යාවේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගනු ලබන සෑම යෙදවුමක්ම භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන පුළුල් සාධක හතරට ඇතුළත් වේ. නිෂ්පාදන සාධක යෙදවුම් ලෙස භාවිතා කර නිමවුම් බවට පෙරලීමේ නිෂ්පාදන ක්‍රියාවලිය පදනම් කරගෙන ලෝකයේ සෑම රටක්ම දළ දේශීය නිෂ්පාදිතයනිෂ්පාදන ආදායම්හා වියදම් හා යන ක්‍රම එකක් හෝ කිහිපයක් ඔස්සේ ගණනය කරනු ලබයි.

දළ දේශීය නිෂ්පාදිතය පදනම් කරගෙන ආර්ථික වර්ධනය ඇතුළු තවත් ආර්ථිකමය වශයෙන් භාවිතා කරන මිනුම් රාශියක් ගණනය කරන අතර එම ගණනය කිරීම් තව දුරටත් විශ්ලේෂණය කිරීමෙන් ආර්ථිකයේ ස්වරූපයන් අධ්‍යයනය කළ හැක. වර්තමානයේ දළ දේශීය නිෂ්පාදිතයට හා ආර්ථික වර්ධනයට එක් එක් අංශවලින් කරන දායකත්වය ගැන කරන අධ්‍යනයන්ගෙන් ඔබ්බට ගොස් ආර්ථික වර්ධනයට නිෂ්පාදන සාධකවලින් කරන දායකත්වය අධ්‍යයනය කිරීම දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ආර්ථික වර්ධනය සඳහා එක් එක් නිෂ්පාදන සාධකවල ඵලදායිතාව කොපමණ ද යන්න අධ්‍යයනය කිරීම මෙන්ම ආර්ථික වර්ධනය සඳහා දායක වන තාක්ෂණික ප්‍රගතිය හා නිෂ්පාදන කාර්යක්ෂමතාව ඇතුළත් මුළු සාධක ඵලදායිතාවය කොපමණ ද යන්න අධ්‍යයනය කිරීම ආර්ථික මෙහෙයුම් කටයුතුවලට මෙන්ම අනාගත ආර්ථික සැලසුම් සම්පාදනය සහ නිෂ්පාදන සාධක කාර්යක්ෂමතාව භාවිතා කිරීම උදෙසා ද ඉතාමත්ම ප්‍රයෝජනවත් වේ. ශ්‍රී ලංකාවේ දැනට ආර්ථික වර්ධනය සඳහා නිෂ්පාදන සාධකවල ඵලදායීතාව පිළිබඳ කරන ලද අධ්‍යයනයන් සීමා සහිත අතර එවන් පුළුල් අධ්‍යයනයක ප්‍රමුඛ අවශ්‍යතාවයක් ද පවතී.

මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා සාධක ඵලදායීතාවය අතර පවතින අන්තර් සම්බන්ධතාවය ඇස්තමේන්තු කිරීම මෙන්ම ඉතාමත් අඩු අවධානයකින් යුතු ආර්ථික වර්ධනයට බලපාන තාක්ෂණික ප්‍රගතිය හා නිෂ්පාදන කාර්යක්ෂමතාව ඇස්තමේන්තු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර එහි වැදගත්කම ඇස්තමේන්තු කිරීම මෙම අධ්‍යයනය මගින් සිදු කර ඇත.

අධ්‍යයනයේ දී නිෂ්පාදන ශ්‍රිතය ඇස්තමේන්තු කිරීම සඳහා කොබ් - ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතය භාවිතා කරන ලද අතර සෝලෝ වර්ධන ආකෘතියට අනුව තාක්ෂණික ප්‍රගතිය ඇස්තමේන්තු කොට එහි වෙනස්වීම සමස්ත සාධක ඵලදායිතාවය ලෙස සලකා ඇත. එම අධ්‍යයනය සඳහා 1990 සිට 2008 දක්වා කාලය තුළ අදාළ ආර්ථික වර්ධනයට අදාළ දත්ත යොදා ගන්නා ලදී. ශ්‍රමය නියෝජනය කිරීම සඳහා රටෙහි මුළු ශ්‍රම බලකාය පිළිබඳ දත්ත ජන හා සංඛ්‍යාලේඛණ දෙපාරතමේන්තුවේ ත්‍රෛමාසික සමීක්ෂණයෙන් ද ප්‍රාග්ධන තොගය නියෝජනය කිරීම සඳහා අවශ්‍ය දත්ත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ දක්වා ඇති දත්ත තුළින් ද ලබා ගන්නා ලදී.

ආර්ථික වර්ධනය හා මුළු සාධක ඵලදායිතාවය අතර සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා කාල ශ්‍රේණි අධ්‍යයනයක් මගින් සිදු කරන ලද අතර අවශ්‍ය ඒකමූල පරීක්ෂා සහ සානුකලන පරීක්ෂා ආදී ආර්ථික මිථික පරීක්ෂාවන් ද අදාළ පරිදි සිදු කරන ලදී. එසේම වර්ධන ගිණුම්කරණ ක්‍රමවේදය මගින් ආර්ථික මිථික ඇස්තමේන්තුවල නිරවද්‍යතාවය ද නැවත විමසා බලන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට නිෂ්පාදන සාධක ඵලදායිතාව කොපමණ ද යන්න එක් එක් සාධක වෙන් වෙන්ව ද මුළු සාධක ඵලදායීතාවය සමස්තයක් ලෙස ද ඇස්තමේන්තු කර ඇත.



**මුඛ්‍ය පද :**

නිෂ්පාදන ක්‍රියාවලිය, සාධක ඵලදායිතාව, ආර්ථික වර්ධනය, කාල ශ්‍රේණිඅධ්‍යයනය, නිෂ්පාදන ශ්‍රිතය

# Abstract

In the production process, every resource consumed in the production process can be broadly categorized into their factors of production namely; land, labour, capital orentrepreneurship. The total value added in this process where an output was made by utilising the input is commonly known as the Gross Domestic Product (GDP) of an economy. Countries compile this estimate at least under a one approach out of the production, income or expenditure fronts.

Based on the GDP compilations, many other important economic estimates such as the growth of an economy could be derived. Detail analysis of these estimates would permit to have a better understanding on the economic condition of a country. Recent literature focus in to calculating the contribution form factors of production to the economic growth beyond the conventional studies on sectorial contributions. Accordingly, productivity considerations in terms of factors of production as well as the total factor productivity gained importance in recent literature to manage economies prudently. Such findings undoubtedly be beneficial in considering the factor efficiency in preparation of future strategies of an economy. Hence, there is an imperative necessity of a broad study on the impact of the factors of production on the economic growth, since there are a limited number of studies focusing on the selected subject area.

This study focuses on estimating the interconnectivity between factor productivity and the economic growth in Sri Lanka, emphasizing on the importance of estimating the technological progress and the production efficiency of the economy.

The Solow growth model which uses the Cobb-Douglas type production function was applied in estimating the technological progress in the study. The change in technological progress would be the total factor productivity of the economy. The applicable study period is from 1990 to 2008. The production factor of 'Labour' was represented by labour force data of the Department of Census and Statistics and the Gross Domestic Fixed Capital Formation obtained from the Central Bank of Sri Lanka publications was used as a proxy to the 'Capital Stock' of the country.

A time series analysis was used to identify the relationship between economic growth and the total factor productivity and econometric techniques such as regression analysis, unit-root tests and cointegration tests were applied as applicable. Moreover, growth accounting procedure was employed in assessing the obtained econometric estimates. Accordingly, this study had estimated the individual contribution of the factors of production to the economic growth as well as the total factor productivity of the Sri Lankan economy.



**Keywords:**

Production process, factor productivity, economic growth, regression analysis, production function